Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## අඹගමුව ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ අඹගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් සපුරා ඇති අඹගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් 2018.11.23 වැනි දිනට පෙර, ලේකම්, අඹගමුව ප්‍රාදේශීය සභාව, ගිනිගත්හේන යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු ය. තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතු ය.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| සේවා ගණය : ප්‍රාථමික ශිල්පීය | | | | | |
| 01 | රියැදුරු III ශ්‍රේණිය | 04 | | PL 3 - 2016 රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | 01. විවෘත බඳවා ගැනීම් - 70%<br>* අධ්‍යාපන සුදුසුකම් :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2ක් සහිතව විෂයයන් 6ක් සමත්ව තිබීම, මින් විෂයයන් 5ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය.<br>* වෘත්තීය සුදුසුකම්<br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ, තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියැදුරු බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර 3කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව ඒ/ඒ1/බී/බී1/සී/සී1/සීඉ/ඩී1/ජී/ජී1/ජේ පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)<br>* පළපුරුද්ද :<br>මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 3ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)<br>* කායික සුදුසුකම් :<br>✓ සෑම අපේක්ෂකයෙකුටම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.<br>✓ අවම උස අඩි 05 අඟල් 02, 1/2 ක් විය යුතුය.<br>✓ මහා මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | * බඳවා ගැනීමේ ක්‍රමය<br>අඹගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂක-යන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.<br>(පරීක්ෂණ තොරතුරු පහතින් දක්වා ඇත.)<br><br>02. සීමිත බඳවා ගැනීම් - 30%<br>* දැනටමත් අඹගමුව ප්‍රාදේශීය සභාවේ තනතුරක ස්ථිර කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති සේවකයින් සඳහා අදාළ වේ.<br><br>* අධ්‍යාපන සුදුසුකම්<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2 ක් සහිතව විෂයන් 6ක් සමත් ව තිබීම. මින් විෂයයන් 5ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය.<br><br>* වෘත්තීය සුදුසුකම්<br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ, තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියැදුරු බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර 3කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරි විසින් නිකුත් කරන ලද ඒ පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඒ/ඒ1/බී/බී1/සී/සී1/ සීඉ/ඩී1/ජී/ජී1/ජේ පන්ති-යේ බලපත්‍රයක් ලබා තිබීම.)<br><br>* පළපුරුද්ද<br>මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 3ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)<br><br>* කායික සුදුසුකම් :<br>✓ සෑම අපේක්ෂකයෙකුටම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.<br>✓ අවම උස අඩි 05 අඟල් 02, 1/2 ක් විය යුතුය.<br>✓ මහා මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | * බඳවා ගැනීමේ ක්‍රමය<br><br>කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකදී සුදුසුකම් ලබා ගත යුතුය. (පරීක්ෂණ තොරතුරු පහතින් දක්වා ඇත.) |

| 01. සේවා ගණය : ප්‍රාථමික ශිල්පීය නොවන | | | | විවෘත බඳවා ගැනීම් - 100% | |
|---|---|---|---|---|---|
| 02 | කාර්යාල කාර්ය සහායක - III ශ්‍රේණිය | 02 | අඹගමුව ප්‍රාදේශීය සභා කාර්යාලය | PL - 1-2016<br><br>රු. 24,250 -10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/- | * අධ්‍යාපන සුදුසුකම්<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2ක් සහිතව විෂයයන් 6ක් සමත්ව තිබීම. මින් විෂයයන් 5ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |
| 03 | පුස්තකාල සහායක - III ශ්‍රේණිය | 02 | සභා බල ප්‍රදේශය තුල | PL - 1-2016<br><br>රු. 24,250 -10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/- | * අධ්‍යාපන සුදුසුකම්<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2ක් සහිතව විෂයයන් 6ක් සමත්ව තිබීම. මින් විෂයයන් 5ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |
| 04 | ජල කම්කරු - III ශ්‍රේණිය | 04 | නෝටන් වටවල | PL - 1-2016<br><br>රු. 24,250 -10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/- | * අධ්‍යාපන සුදුසුකම්<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2ක් සහිතව විෂයයන් 6ක් සමත්ව තිබීම. මින් විෂයයන් 5ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |
| 05 | ක්ෂේත්‍ර කම්කරු - III ශ්‍රේණිය | 07 | සභාබල ප්‍රදේශය තුළ සේවා ව්‍යවස්ථාව අනුව පනවා ඇති කාර්යයන් ඉටු කිරීම. | PL - 1-2016<br><br>රු. 24,250 -10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/- | * අධ්‍යාපන සුදුසුකම්<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2ක් සහිතව විෂයයන් 6ක් සමත්ව තිබීම. මින් විෂයයන් 5ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 06 | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 06 | සභාබල ප්‍රදේශය තුළ සේවා ව්‍යවස්ථාව අනුව පනවා ඇති කාර්යයන් ඉටු කිරීම. | PL - 1-2016<br>රු. 24,250 -10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/- | අධ්‍යාපන සුදුසුකම්<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2ක් සහිතව විෂයන් 6ක් සමත්ව තිබීම. මින් විෂයන් 5ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. ඉහත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ප්‍රමාණවත් නොවූ විට පස්වන (05) ශ්‍රේණිය සමත් වීම සුදුසුකමක් සේ සලකා බලනු ලැබේ. |

පළාත් පාලන රියදුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය - විවෘත බඳවා ගැනීම සඳහා

01. ලිඛිත විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | මුළු ලකුණු සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |

තරග විභාගයට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ.

සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබා ගත යුතු වේ.

විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 3. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවර්ණ ප්‍රශ්න පත්‍රයකි. |
| 4. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවර්ණ ප්‍රශ්න පත්‍රයකි |

.

02. වෘත්තීය පරීක්ෂණය :

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණය මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |
| 2. මහා මාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

පළාත් පාලන රියදුරු සේවයට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සමත් වූවන් සඳහා පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණය - සීමිත බඳවා ගැනීම සඳහා

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණය මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |
| 2. මහා මාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

02. *බඳවා ගැනීමේ කොන්දේසි :*

01. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

02. අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

03. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර තුනක (3) කාලයක් අඹගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

04. අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක ස්ථිර සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදළ නොවේ.)

05. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදළව ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

06. බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

07. රියදුරු තනතුර සඳහා ඉල්ලුම් කරන අය ලිඛිත පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතු අතර, අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා ඇති හා ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

සීමිත බඳවා ගැනීමේ දී කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් (ශිල්පීය නොවන තනතුරු සඳහා) මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

08. දැනටමත් අඹගමුව ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, දීමනා, කොන්ත්‍රාත් හෝ කුලී පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

09. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලටද පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටද අඹගමුව ප්‍රාදේශීය සභාව දැනට පනවා ඇති හා පනවනු ලබන නීතිවලට හා එකී නීති රීති සියල්ලට යටත් විය යුතුය.

10. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

11. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පතක් කැඳවන අතරතුර බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය අඹගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

02. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

03. බඳවා ගනු ලබන අය වසර 03ක පරිවාස කාලයකට යටත්ය. එම කාලය තුල දී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදයක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

04. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

05. බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ බඳවා ගැනීම් සඳහා වන අනෙකුත් පොදු කොන්දේසි වලට යටත් විය යුතුය.

06. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, කවර බල ප්‍රදේශයක් තුල කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තෙකු විය යුතුය.

07. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

08. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය. අඹගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කෙරෙන ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

09. සේවයේ අකාර්යක්ෂමතාවයක් හෝ අසතුටුදායක තත්වයක් පෙනී ගියහොත් සභාවේ මනාපය පරිදි සේවය අවසන් කිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතුය.

04. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය ඃ

මෙම නිවේදනය අවසානයේ දක්වෙන ආදර්ශ අයදුම්පත්‍ර අනුව A 4 ප්‍රමාණයේ දෙපැත්ත භාවිතා කර සකස් කළ අයදුම්පත්‍රයක් 2018.11.23 වැනි දින හෝ එදිනට පෙර, "ලේකම්, අඹගමුව ප්‍රාදේශීය සභාව, ගිනිගත්හේන" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතුය. තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවෙන අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අයදුම්පත් සමඟ පහත සඳහන් ලිපිලේඛනවල පිටපත් අමුණා එවිය යුතුය.

* උප්පැන්න සහතිකය,
* ජාතික හැඳුනුම්පත,
* අධ්‍යාපන සහතික,
* ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතුය.),
* වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතික,
* සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
* මෑතකදී ලබා ගත් චරිත සහතික 2ක්.

ලේකම්,
අඹගමුව ප්‍රාදේශීය සභාව,
ගිනිගත්හේන.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ - අඹගමුව ප්‍රාදේශීය සභාවේ**

**........................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය**

..................................
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාග අංකය ..................................

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ඃ (රියදුරන් සඳහා)

(අදාල සංකේතය කොටුව තුළ යොදන්න.) (සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E ) ☐

01. සම්පූර්ණ නම :....................................................

02. ස්ථිර ලිපිනය :...................................................

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :....................................................

04. ජාතික හැඳුනුම්පත් අංකය :...................................... (ඡායා පිටපතක් ඇමිණිය යුතුය.)

05. උපන්දිනය : වර්ෂය :............... මාසය :............... දිනය :...............

06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු:............... මාස :............... දින :...............

07. ස්ත්‍රී/ පුරුෂ භාවය :................................ :

08. විවාහක/ අවිවාහක යන වග :................................

09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද? :.................................

10. දැනට තනතුරක් දරන්නේ නම් එම විස්තර :
   a. තනතුරේ නම :....................................
   b. එයට පත් වූ දිනය :....................................
   c. පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික) :....................................
   d. මැතිවරණ කොට්ඨාසය :....................................
   e. පළපුරුද්ද හා සේවා කාලය :....................................

11. අධ්‍යාපන සුදුසුකම් (සාමර්ථ වී ඇති උපරිම ශ්‍රේණියේ සහතිකවල පිටපතක් ඇමිණිය යුතුයි.)
අ. පො.ස. (සා.පෙ.) විභාගය :....................................

සමත් වර්ෂය :.................... විභාග අංකය :.........................

| අනු. අංකය | විෂයය | සාමාර්ථය | අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

12. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :......................................................
(තාක්ෂණික දැනුම පිළිබඳ සහතිකවල මුල් පිටපත් ඇමිණිය යුතුය.)
13. වෘත්තීය සුදුසුකම් :......................................................
14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටීද? ඔව්/නැත.:.................................
15. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :

ඉහත සඳහන් අංක 01 - 15 දක්වා මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව තේරුම්ගෙන ඇති බවත්, ඉල්ලුම්පත්‍ර කැඳවීමේ කොන්දේසිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

...............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :................................ .

දැනටමත් රජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ............................................... මයා/ මහත්මිය/ මෙනවිය දැනට මෙම ආයතනයේ ................................. .......... කු වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැක./ නොහැක. ඔහු/ ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

...........................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව).

නම : ......................................
තනතුර : ......................................
ආයතනය : ......................................